:1* සෑම රටකම ආර්ථික සංවර්ධයෙහි ලා සුවිශේෂී වූ කාර්යභාරයක් එරටෙහි කුඩා පරිමාණ ව්‍යාපාර විසින් ඉටු කිරීම නොරහසකි.

i. ව්‍යාපාර ප්‍රමාණාත්මකව වර්ග කිරීම සඳහා යොදාගත හැකි සාධක දෙකක් නම් කරන්න.

ii. කුඩා ව්‍යාපාරවල ගති ලක්ෂණ මොනවාද?

iii. කුඩා ව්‍යාපාර සංවර්ධනය කිරීමෙහිලා රජයට ගතහැකි ක්‍රියා මාර්ග කවරේ ද?

iv. කුඩා ව්‍යාපාර මගින් රටේ ආර්ථික සංවර්ධනයට කවර දායකත්වයක් සැපයේද?

v. කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු මොනවාද?

:2* ව්‍යාපාර පරිසරය ගතිකය. නිතර වෙනස් වන සුළුය. එම නිසා ව්‍යාපාර පරිසරය හොඳින් අධ්‍යයනය කිරීම ව්‍යවසායකයෙකුට ව්‍යාපාර ආරම්භය සඳහා යහපත් ප්‍රවේශයක් වනු ඇත.

i. ව්‍යාපාර පරිසරය ඔබ හඳුනා ගන්නේ කෙසේද?

ii. අභ්‍යන්තර පරිසර සාධක දෙකක් ලෙස අයිතිකරුවන් සහ සේවකයන් ආශ්‍රිත ශක්තීන් එක බැගින් දක්වන්න.

iii. ආර්ථික පරිසරය තුළ ක්‍රියාකාරී සාධක මොනවාද?

iv. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය තුළින් ව්‍යවසායකයෙකුට අත්වන ප්‍රයෝජන කවරේද?

v. "බාහිර පරිසරයේ තර්ජන ඔස්සේ අවස්ථා ද උදාවිය හැක." මෙම ප්‍රකාශයට ඔබ එකඟද? උදාහරණයක් පමණක් සපයන්න.